රාහුල විද්‍යාලයීය වර්ණ ප්‍රදානය
2025 වර්ෂය සඳහා දක්ෂතම ක්‍රීඩකයා තේරීම.

<u>මූලික සුදුසුකම්</u>

මේ සඳහා තේරී පත්වීමට පහත දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා තිබිය යුතු අතර ක්‍රීඩා අංශයෙන් ලබාගන්නා අයදුම්පත සම්පූර්ණ කර අදාළ ක්‍රීඩා සහතික වල ඡායා පිටපත් අයදුම්කරු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර එම සියළු සහතික පිළිබඳ තොරතුරු ඇතුළත් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ද සමග 2026.11.18 දිනට පෙර ක්‍රීඩා අංශය වෙත ලබා දිය යුතු ය.

1. වයස අවුරුදු 17 න් පහළ, 18 න් පහළ, 19 න් පහළ හෝ 20 න් පහළ ක්‍රීඩා කණ්ඩායමක්/ කණ්ඩායම් නියෝජනය කිරීම/ කර තිබීම.
2. අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 16 සම්පූර්ණ වීම/ 16ට වැඩි වීම.
3. වර්ණ ප්‍රදාන පාදක වර්ෂයේ පාසල නියෝජනය කරන/කළ ක්‍රීඩකයෙක් වීම.
4. අදාළ වර්ෂයේ රාහුල විද්‍යාලයේ ක්‍රීඩා වර්ණලාභියෙකු වීම.

<u>ක්‍රීඩා සුදුසුකම්</u>

මේ සඳහා තේරී පත්වීමට පහත දක්වා ඇති ක්‍රීඩා සුදුසුකම් / සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

1. රාහුල විද්‍යාලය නියෝජනය කරමින්, ක්‍රීඩා සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන වර්ණලාභියෙකු වීම. (ආසන්න වසර 4ක් තුළ)
2. ජාතික වාර්තාවක හිමිකාරිත්වය / සමස්ත ලංකා පාසල් වාර්තාවක හිමිකාරිත්වය
3. අධ්‍යාපන අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය අනුබද්ධ පාසල් ක්‍රීඩා සංගම් හෝ ජාතික ක්‍රීඩා සංගම් හෝ මගින් තේරීම් සිදුකොට අන්තර්ජාතික තරගාවලි/තරගාවලියක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර ජයග්‍රහනය කිරීම හෝ සහභාගීත්වය.

   <u>අන්තර්ජාතික තරගාවලි ප්‍රමුඛතා අනුපිළිවෙල</u>
   - ඔලිම්පික් තරගාවලි
   - ලෝක තරගාවලි
   - පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලි
   - ආසියානු තරගාවලි
   - දකුණු ආසියානු තරගාවලි
   - ලෝක කනිෂ්ඨ තරගාවලි
   - පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන්/ කනිෂ්ඨ තරගාවලි
   - ආසියානු යොවුන්/ කනිෂ්ඨ තරගාවලි
   - දකුණු ආසියානු කනිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ තරගාවලි

   <u>වසර කිහිපයකට වරක් පවත්වනු ලබන තරගාවලීන් (උදා- ඔලිම්පික්....)</u>
   - අදාළ ජයග්‍රහණය, දක්ෂතම ක්‍රීඩකයා තේරීම් අනුයාත අවස්ථා/වසර දෙකකදී පමණක් සලකා බලනු ලැබේ.
   - ඉහත කුසලතාවයක් මත එක් වරක් දක්ෂතම ක්‍රීඩකයා ලෙස ඇගයීමට ලක්වූ ක්‍රීඩකයෙකු සඳහා ඉදිරි වසර වලදී එම දක්ෂතාවය සලකා බලනු නොලැබේ.

4. අධ්‍යාපන ලේකම්ගේ හෝ ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කිරීම.
5. අධ්‍යාපන අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය අනුබද්ධ පාසල් ක්‍රීඩා සංගම් හෝ ජාතික ක්‍රීඩා සංගම් හෝ මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ තරගාවලියක විද්‍යාලය නියෝජනය කරමින් 1,2,3 ස්ථාන ලබා තිබීම.

6. අදාළ වර්ෂයේ ජාතික සංගම් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් වලදී ඒ ඒ වයස් සීමා වලදී මුල් අටදෙනා අතරට පැමිණීම.

තේරීම් ක්‍රමවේදය

1. විදුහල්පති / පාසල් කළමනාකරණ කමිටුව විසින් නම් කරනු ලබන තේරීම් කමිටුවක්/ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් තේරීම සිදු කෙරේ.
2. පාසල් වර්ණ සඳහා අයදුම්කල ක්‍රීඩකයන් අතරින් මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් සලකා බලනු ලැබේ.
3. ක්‍රීඩා භාර ආචාර්යවරයා මගින් අදාළ වර්ෂයේ ඉහත අංක 02 ට අනුව ඒ ඒ ක්‍රීඩාවන් වෙනුවෙන් සුදුසුකම් සපුරා ඇති ක්‍රීඩකයින් අතරින් දක්ෂත ම ක්‍රීඩකයා සඳහා ඉල්ලුම් කර ඇති ක්‍රීඩකයින්ගේ සහතික පත්‍ර හා අනෙකුත් ලිපි ලේඛන ගොනු, තේරීම් කමිටුවට ඉදිරිපත් කළ යුතුය. මෙහිදී ඉදිරිපත් කරනු ලබන සහතික/ ලිපි අංක කොට අනුපිළිවෙලින් ලේඛනයක් සකසා මුළු සහතික සංඛ්‍යාව සඳහන් කොට ක්‍රීඩකයා විසින් අත්සන් කර ඉදිරිපත් කළ යුතු ය.
4. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණයක් සිදු කොට පහත අංශ යටතේ ලකුණු ලබාදීම සිදු කර ඉහළම ලකුණු ලබා ගන්නා ක්‍රීඩකයා වසරේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස නම් කරනු ලැබේ. ලකුණු සටහන ඇමුණුම 01 හි දක්වා ඇත.(අංශයක් සඳහා ලකුණු ලබාදීම සිදු කරන්නේ එම අංශයෙන් ඉහළම එක් දක්ෂතාවයක් සඳහා පමණි.)
    (i) ක්‍රීඩා වර්ණ
    (ii) ක්‍රීඩා වාර්තා
    (iii)ජාත්‍යන්තර තරග
    (iv)ක්‍රීඩා තරගාවලි
    (v) ශ්‍රේණිගත කිරීම්/දක්ෂතා

5. ක්‍රීඩකයින් කිහිපදෙනෙකු සම ලකුණු ලබා සිටින අවස්ථා වල ඉහළ ම වයස් කාණ්ඩයට අයත් ක්‍රීඩකයාට ප්‍රමුඛතාවය හිමි වේ.
6. තවදුරටත් සම තත්වයේ ලකුණු හිමි ක්‍රීඩකයන් සිටින අවස්ථා වල ඔලිම්පික් ක්‍රීඩා සඳහා අනුමත ක්‍රීඩාවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.
7. ඉහත 6 අනුව සලකා බැලීමේදී තවදුරටත් සම තත්වයේ පවතී නම් එම ක්‍රීඩකයන්ගේ දෙවන හෝ ඊළඟ දක්ෂතාවය **ක්‍රීඩා සුදුසුකම්** හි අනුපිළිවෙලින් සලකා බලනු ලැබේ.
8. ක්‍රීඩා සුදුසුකම් හි අනුපිළිවෙල යනු **ක්‍රීඩා සුදුසුකම්** හි දක්වා ඇති අංක 01 සිට 06 දක්වා (අංක01 > අංක 06) අනුපිළිවෙල ම වේ.
9. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දෙන ලකුණු පිළිබඳ අවසන් එකඟතාවයකට ක්‍රීඩකයා එළඹිය යුතු අතර පසුව අභියාචනා හෝ සහතික ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව හිමි නොවේ.
10. තේරීම් කමිටුව/ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

පොදු කරුණු

1. දක්ෂතම ක්‍රීඩකයා තේරීමේදී,
    - අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන තරගාවලි
    - පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා මට්ටමේ තරගාවලි
    - ජාතික සංගමය මගින් සංවිධානය කරන තරගාවලි
      පමණක් සලකා බලනු ලැබේ.
    - ජාත්‍යන්තර තරග වලට සහභාගී වීමේදී අදාළ ක්‍රීඩකයා අදාළ ක්‍රීඩාවේ අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් සංගමය, ජාතික සංගමය නියෝජනය තහවුරු කළ යුතු අතර අවශ්‍ය විටකදී අදාළ ජාතික ක්‍රීඩා තේරීම් කමිටු නිර්දේශිත ලිපිය ඉදිරිපත් කළ යුතුය.

- ජාත්‍යන්තර තරගාවලියක් ලෙස පිළිගැනෙන්නේ අදාළ ක්‍රීඩාවේ මව් සංගමය හෝ ප්‍රධාන අනුබද්ධ සංගමයක් විසින් සංවිධානය කරනු ලබන රටවල් 06 ක් හෝ ඊට වඩා වැඩි රටවල් සංඛ්‍යාවකින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සහභාගී වන අන්තර් ජාතික තරගාවලියන්ය.
- ඉල්ලුම්කරුවන් සියළුදෙනා අතරින් වැඩිම සුදුසුකම් සහිත ක්‍රීඩකයා අදාළ වර්ෂය සඳහා දක්ෂතම ක්‍රීඩකයා ලෙස තේරී පත්වීමට සුදුසුකම් ලබයි.

2. ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් ලෙස පිළිගැනෙන්නේ පාසල් කිහිපයකට අයත් ක්‍රීඩකයන්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කණ්ඩායමක් වන අතර, ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් ලෙස විද්‍යාලයීය කණ්ඩායම නියෝජනය කළ අවස්ථාවක එය ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් නියෝජනයක් ලෙස නොසැලකෙන අතර, එය දක්ෂතම ක්‍රීඩකයා තේරීම සඳහා අදාළ නොවේ.
3. ආරාධනා මත ජාත්‍යන්තර තරගාවලියකට සහභාගී වන ජයග්‍රාහී කණ්ඩායම්, මෙහිදී සලකා බලනු නොලැබේ. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සංගමයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා ජාතික ක්‍රීඩා සංගමයක් නියෝජනය කරන ක්‍රීඩකයෙකුට මේ සඳහා හිමිකමක් ඇති නමුත් මෙහිදී එම ක්‍රීඩකයා සහභාගී වන තරගාවලිය එම රටේ අදාළ ක්‍රීඩාවේ මව් සංගමය හෝ ඊට අනුබද්ධ ප්‍රධාන සංගමයක් මගින් සංවිධානය කර තිබිය යුතුය. මෙම අවශ්‍යතාව සපුරා නොමැති නම් ක්‍රීඩකයින් ශ්‍රී ලංකා පාසල් සංගමය නියෝජනය කළද මේ සඳහා හිමිකම් නොලැබේ.
4. අදාළ වර්ෂයේ ජාතික සංගම් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් වලදී ඒ ඒ වයස් සීමා වලදී ලංකාවේ මුල් 3 දෙනා අතරට පැමිණීම සුදුසුකමක් වේ. (ජාතික සංගමයේ ශ්‍රේණිගත කිරීමේ ඡායා පිටපතක් අමුණා තිබිය යුතු අතර එය අදාළ සංගමය විසින් අනුමත කර තිබිය යුතුයි.)
5. කිසියම් ක්‍රීඩකයෙකු විසින් තමන් සහභාගී වූ තරගාවලියකදී ක්‍රීඩා නීති රීති උල්ලංඝය කිරීමේ වරදට දඬුවම් ලබා තිබීම, පාසල් විනය නීති රීති බරපතල ලෙස උල්ලංඝනය කර විනය මණ්ඩලය විසින් දඬුවම් ලබා දී ඇති අවස්ථාවක එම ක්‍රීඩකයා, දක්ෂතම ක්‍රීඩකයා වීම සඳහා සුදුසුකම් නොලබයි.මේ සඳහා පාසල් විනය මණ්ඩලය හෝ පරිපාලන මණ්ඩලය මගින් ඒ බව ලිඛිතව තේරීමේ කමිටුව වෙත දැනුම් දිය යුතුය.

අත්/කළේ
එච්.කේ.එල්.බී.විරාජිත්
විදුහල්පති
රාහුල විද්‍යාලය
මාතර

ලකුණු සටහන - මුළු ලකුණු 100

අංශය	විස්තරය	කේවළ තරග	කණ්ඩායම්/යුගල තරග
ක්‍රීඩා වර්ණ (උපරිම ලකුණු 20)	ජාතික වර්ණ	20	20
	පාසල් වර්ණ	15	15
ක්‍රීඩා වාර්තා (උපරිම ලකුණු 20)	ජාත්‍යන්තර වාර්තා	20	20
	ජාතික වාර්තා	15	15
	තරග වාර්තා- සමස්ත ලංකා මට්ටම	10	10
ජාත්‍යන්තර තරග (උපරිම ලකුණු 34)	කණ්ඩායම් නායක	02	02
	කණ්ඩායම් උපනායක	01	01
	ඔලිම්පික්/පැරා ඔලිම්පික්/ලෝක		
	➢ ප්‍රථම ස්ථානය	32	30
	➢ දෙවන ස්ථානය	31	29
	➢ තෙවන ස්ථානය	30	28
	➢ සහභාගීත්වය	29	27
	පොදු රාජ්‍ය මණ්ඩල / ආසියානු		
	➢ ප්‍රථම ස්ථානය	30	28
	➢ දෙවන ස්ථානය	29	27
	➢ තෙවන ස්ථානය	28	26
	➢ සහභාගීත්වය	27	25
	දකුණු ආසියානු/ ලෝක කනිෂ්ඨ		
	➢ ප්‍රථම ස්ථානය	28	26
	➢ දෙවන ස්ථානය	27	25
	➢ තෙවන ස්ථානය	26	24
	➢ සහභාගීත්වය	25	23
	පොදු රාජ්‍ය මණ්ඩල /ආසියානු (යොවුන්/ කනිෂ්ඨ)		
	➢ ප්‍රථම ස්ථානය	26	24
	➢ දෙවන ස්ථානය	25	23
	➢ තෙවන ස්ථානය	24	22
	➢ සහභාගීත්වය	23	21
	දකුණු ආසියානු (යොවුන්/ කනිෂ්ඨ)		
	➢ ප්‍රථම ස්ථානය	24	22
	➢ දෙවන ස්ථානය	23	21
	➢ තෙවන ස්ථානය	22	20
	➢ සහභාගීත්වය	21	19
ක්‍රීඩා තරගාවලි (උපරිම ලකුණු 18)	➢ ප්‍රථම ස්ථානය	18	16
	➢ දෙවන ස්ථානය	16	14
	➢ තෙවන ස්ථානය	14	12
ශ්‍රේණිගත කිරීම්/දක්ෂතා (උපරිම ලකුණු 08)	1 සිට 8 දක්වා	8 සිට1	-
	දක්ෂතම ක්‍රීඩකයා - ජාතික තරගාවලි	08	-
	වයස් කාණ්ඩ හෝ එක් එක් අංශ (උදා-දක්ෂතම පන්දු යවන්නා) දක්ෂතම ක්‍රීඩකයා - ජාතික තරගාවලි	05	-